*Vidyodaya J. Arts, Sci. Lett., Vol.* 13, *No.* 2, *July* 1985 *pp.* 49 - 51

# පාලි 'හත්ථ' පිළිබඳ අර්ථකථන

චන්ද්‍රා වික්‍රමගමගේ

''හත්ථ'' යන්න සංස්කෘත ''හස්ත'' යන්නෙහි පාලි රූපයයි. ඉන්දියානු වාස්තු විද්‍යාවේ මිනුම් ඒකකයක් වන එය ලංකාව ඇතුළු ඉන්දියාව අවට රටවල ද ප්‍රාදේශීය භාෂාවලට බිඳගෙන හෝ පරිවර්තනය කරගෙන භාවිතා කර තිබේ. මිනුම් ඒකකයක් වශයෙන් ''හත්ථ'' යන්නෙහි අගය නූතන පඬිවරුන් විසින් විවිධාකාරයෙන් වටහා ගෙන තිබෙන අතර පැරණි ගොඩනැගිලිවල දිග, පළල හා උස විස්තර කිරීමේදී වැරදි මිනුම් ප්‍රමාණ දී තිබේ. එම නිසා පැරණි ලංකාවේ ''හත්ථ'' යන්න භාවිතා වූයේ කෙබඳු නිශ්චිත මිනුම් ප්‍රමාණයක් සඳහාද? යන්න විමසා බැලීම පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතාම අවශ්‍ය වී තිබේ.

1906 දී ෆ්ලීට් ''හත්ථය'' අඟල් 17.75 කට වඩා කුඩා නොවිය හැක්කා වූ ද අඟල් 18.25 කට වඩා වැඩි නොවිය හැක්කා වූ ද මිනුම් ඒකකයක් ලෙස ගෙන තිබේ.[1] ඊට අවුරුදු හයකට පසු ඔහු ''හත්ථ'' සාමාන්‍යයෙන් අඟල් 18ක් ලෙස සලකා තිබේ.[2] විල්හෙල්ම් ගයිගර් ඔහුගේ චූලවංස පරිවර්තනයේදී ෆ්ලීට්ගේ අර්ථකථනය නිවැරදි ලෙස පිළිගෙන තිබේ.[3] ශ්‍රීමත් ජේම්ස් එමර්සන් ටෙනන්ට් ශ්‍රී ලංකාවේ ''හත්ථ'' අඩි දෙකයි අඟල් 3 ක් එනම් අඟල් 27 ක් ලෙස පිළිගෙන තිබේ. මේ අනුව ඔහු අභයගිරි ස්තූපයේ උස ''හත්ථ'' 180 ක් ලෙස ගෙන එය අඩි වලින් 405 ක් බව දක්වා තිබේ.[4] පැරණි ලංකාවේ වඩු රියන දිගින් අඟල් 30 ක් බව කොඩ්රින්ටන් ප්‍රකාශ කර තිබේ.[5] රියන ඔහු ''හත්ථ'' යන්නේ සිංහල පරිවර්තනය ලෙස සලකා තිබේ. පාලි හත්ථ වැලමිටේ සිට මැදගිල්ලේ අගට ඇති දුර ප්‍රමාණය ලෙස සලකා අඟල් 24 ක් හෝ 18 ක් එයට අයත් බව රීස් ඩේවිඩ්ස් කියා තිබේ. මෙහිදී ඔහු ''රතන'' අඟල් 12 ක් බව කියයි.[6] ෆ්ලීට් රතන අඟල් 18 ක් බව කියයි.[7] පාලි ''රතන'' හා සිංහල රියන සමාන නොවන බව මේ අර්ථ කථනවලින් පෙනීයතත් එහි සත්‍යයක් තිබේදය යනු සැක සහිතයි. (ඒ පිළිබඳව පසුව සලකා බලමු.) කොඩ්රින්ටන්ගේ අර්ථකථනය අනුගමනය කරමින් මහාචාර්ය සෙනරත් පරණවිතාන ද ''හත්ථ'' අඟල් 30 කින් යුක්ත බව පිළිගෙන ඒ අනුව අනුරාධපුර ස්තූපවල උස ප්‍රමාණ දක්වා තිබේ.[8]

මහාචාර්ය එම්. බී. ආරියපාල පාලි හත්ථ යන්න සද්ධර්ම රතනාවලී කතුවරයා විසින් වඩු රියන ලෙස සිංහලට පරිවර්තනය කරගෙන ඇති බවත් එයට අඟල් 24ක් බවත් කියයි. එහි ''අට්ඨපඤ්ඤාසහත්ථුබ්බෙධ'' ''යන්න වඩුරියනින් අටපණස් රියන'' යනුවෙන් පරිවර්තනය කර ඇති බව ඔහු වැඩිදුරටත් පෙන්වා දෙයි. මෙහි දී සිංහල රියන පාලි ''හත්ථ'' වෙනුවට යෙදී ඇති බව ද පෙනේ. තවද වඩුරියන අඟල් 18ක් බව ඔහු කියයි.[9]

ඉහත සඳහන් අර්ථකථනවලට අනුව පාලි ''හත්ථ'' යන්නෙහි සංඛ්‍යාමය අගය පමණක් නොව සිංහල රියන හා පාලි ''හත්ථ'' අතර සම්බන්ධය ද අවිනිශ්චිත තත්ත්වයට පත්ව තිබේ. මේ අවුල ලිහීම සඳහා පැරණි සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක සාධක ඉවහල් කරගත යුතුය.

රියනට වියත් දෙකක් එනම් අඟල් 24 ක් බව ධම්පියා අටුවා ගැටපදයේ සඳහන් වෙයි.[10] මේ ග්‍රන්ථය 10 වැනි ශතවර්ෂයට හෙවත් අනුරාධපුර අග භාගයට අයත්ය. 12 වැනි සියවසට අයත් දහම් සරණෙහි ද එම අදහස තිබේ.[11] 12 වැනි සියවසට හෝ ඊට ආසන්න පසු කාලයේ දී රචිත වාස්තුවිද්‍යා ග්‍රන්ථයක් වන වෛජයන්ති තන්ත්‍රයෙහි ''විතස්තිර් ද්වාදශාංගුල්‍යං ද්විවිතස්තිර් හස්ත මුච්‍යතෙ'' (''විතස්තිය අඟල් 12 කි. විතස්ති දෙක හස්තයයි කියනු ලැබේ'') යන අර්ථකථනය එයි.[12] ක්‍රි. පූ.2 වැනි සියවසේදී දුටුගැමුණු රජු විසින් කරවන ලද ලෝවාමහාපාය දිගින් හා පලලින් හත්ථ 100 ක් බව මහාවංසයේ සඳහන් වෙයි.[13] දැනට නටබුන් ව ඇති මෙම ගොඩනැගිල්ලේ දකුණු පැත්තේ අත්තිවාරම අඩි 200 ක් දිගය. අනිත් පැතිවල ද එම ප්‍රමාණයම වෙයි. මේ ගොඩනැගිල්ලේ පළල අඩි 200 ක් බව ඉන් අනාවරණය වෙයි. ''හත්ථ'' 100 අඩි 200 ලෙස ගත්විට හත්ථයකට අඩි 2 ක්හෙවත් අඟල් 24 ක් වෙයි. සාහිත්‍යමය මූලාශ්‍රයවලින් ලැබී ඇති සාධක සමග මෙය සැසඳේ. ඒ නිසා පැරණි ලංකාවේ (යටත් පිරිසෙයින් 15 වැනි සියවස දක්වා) ''හත්ථ'' (සිංහල රියන) සඳහා අඟල් 24 ක් වූ බවත් එය සිංහලෙන් වඩු රියන ලෙස සලකා ඇති බවත් පෙනේ. උතුරු ඉන්දියානු වාස්තු විද්‍යාවේ ද අඟල් 24 කින් යුත් හස්තයක් වෙයි. එය ''කිෂ්කුහස්ත'' නමින් හැඳින්වෙයි.[14] පණ්ඩිත විදුරුපොල පියතිස්ස හිමියෝ ද ඉංග්‍රීසි ක්‍යුබිට් යන්නට සමාන ලෙස ''රතන'' (සිංහල රියන), ''කුක්කු'' (සංස්කෘත කිෂ්කු) හා ''හත්ථ'' දක්වති.[15]

ගඩලාදෙණි විහාරයේ ගලක කොටා ඇති අඟල් 30 කින් යුත් මිනුම් ඒකකය රියන වශයෙන් කොඩ්රින්ටන් සලකා ඇතත්[16] එවැනි රියනක් ලංකාවේ හෝ ඉන්දියාවේ භාවිතා වූ බවකට සාධක නැත. මානසාර නමැති ඉන්දියානු වාස්තුවිද්‍යා ග්‍රන්ථයෙහි ''හස්ත'' වර්ග 4 ක් වෙයි. කුඩාම හස්තයට අඟල් 24 ක් ද දිග ම හස්තයට අඟල් 27ක් ද වෙයි.[17] මහනුවර යුගයේදී පමණ අඟල් 18 කින් යුත් මිටි රියනක් ද භාවිතා වී තිබේ. මෙය ද්‍රවිඩ රියනයි.

මෙහි සාකච්ඡා කළ කරුණු වලින් පාලි ''හත්ථ'' හා එහි සිංහල වඩු රියන සඳහා අඟල් 24 ක් වූ බවත් එය උතුරු ඉන්දියාවේ භාවිතා වූ කුඩා රියන බවත් පැහැදිලි විය. ලංකාවේ යටත් පිරිසෙයින් 15 වැනි සියවස පමණ දක්වා එම හත්ථය (රියන) භාවිතා වූ හෙයින් අනුරාධපුර පොළොන්නරු ආදී පැරණි නගර හා සම්බන්ධ ව වංසකථාවල එන හත්ථය සිංහල ග්‍රන්ථවල එන වඩුරියනට සමාන ලෙස ගෙන අඟල් 24 කින් යුත් එම මිනුම් ඒකකය අනුව පැරණි ගොඩනැගිලි ආදිය මිනියයුතු බවත් නිගමනය කළ හැකිය.

# සටහන්

1. *Journal of Royal Asiatic Society*, 1906, p. 1011.
2. එම. 1912, p. 237.
3. *Culavamsa*, transl. by W. Geiger, Vol. I, Colombo 1953, p. 16. n. 3; II, p.112. n. 1.
4. Sir James Emerson Tennent, *Ceylon*, Tisara prakasakayo Ltd. Sixth edition, 1977, p. 296. n. 3.
5. H. W. Codrington, "Garputa villars," Rhys Dawids in *Ceylon Journal of Science*, Section G. vol II pt. 2. 1930, p. 133.
6. Pali-English Dictionary, (PTS), Natha සටහන් බලන්න.
7. 2 වැනි අධ්‍යාය ලිපිය
8. ලංකාවේ ස්තූපය. රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුවේ පරිවර්තනය, 1962. 5 පිට.
9. 5 වැනි අධ්‍යාය ලිපිය
10. M. B. Ariyapala, *Soceity in Mediaeval Ceylon, 2nd Print*, 1968, *pp*. 153-154.
11. ධම්පියා අටුවා ගැටපදය, ඩී. බී. ජයතිලක සංස්කරණය, 1932, 119, 180, 287 පිටු.
12. දහම් සරණ, පණ්ඩිත ධම්මානන්ද සංස්කරණය, 1929, 9 පිට.
13. වෛජයන්ති තන්ත්‍රය, නන්දසේන මුදියන්සේ සංස්කරණය, කැළණිය විශ්වවිද්‍යාලය 1983, 1 පරිච්ඡේදය 13 ශ්ලෝකය.
14. මහාවංසය.
15. J. N. Benerjea, Development of Hindu conography, University of Calcutta 1956 p. 320, n. 1; P. K. Acarya, Summary of the manasara, Leiden 1918, p.3.
16. The English - Pali Dictionary, 1949, p. 139.
17. 5 අධ්‍යාය ලිපිය බලන්න.
18. P. K. Acarya, Summary of the manasara, Leiden, 1198, p. 3.